10 ශ්‍රේණිය

කෘෂි හා ආහාර තාක්ෂණය - 1 පිළිතුරු පත්‍රය

දෙවන වාර පරීක්ෂණය

ප්‍රශ්න අංකය	පිළිතුරු	ප්‍රශ්න අංකය	පිළිතුරු
1	4	21	1
2	3	22	2
3	2	23	2
4	4	24	3
5	1	25	1
6	3	26	2
7	3	27	1
8	2	28	1
9	1	29	4
10	2	30	3
11	3	31	3
12	2	32	1
13	3	33	2
14	2	34	3
15	3	35	3
16	3	36	1
17	4	37	2
18	2	38	2
19	3	39	4
20	3	40	4

10 ශ්‍රේණිය
දෙවන වාර පරීක්ෂණය - 2018
කෘෂි හා ආහාර තාක්ෂණය

01.

i. පාංශු ස්ථරයේ තද බව (2 x 1 = 2)
පාංශු ඛාදනය
ආම්ලික හෝ ක්ෂාරීය බව
දිගින් දිගටම එක බෝගයක් වගා කිරීම

ii. කාබනික පොහොර පසට යෙදීම (2 x 1 = 2)
පාංශු සංරක්ෂණ ක්‍රම යෙදීම
නිවැරදි ආකාරයට බිම් සැකසීම (පස බුරුල් කිරීම)
පසට හුණු යෙදීම - කැල්සියම් කාබනේට්, ඩොලමයිට්, හුණුගල් කුඩු
ආම්ලික පොහොර දිගින් දිගටම දැමීමෙන් වැළකීම

iii. SALT වැටි යෙදීම (2 x 1 = 2)
ආවරණ බෝග සිටුවීම
ඉවුරු දෙපස තෘණ වැවීම
පාංශු පුනරුත්ථාපන බෝග වැවීම (උදාහරණ - ගෞතමාලා)

iv. උඳු, මුං, කව්පි, කඩල ආදි නිවැරදි පිළිතුරු (2 x 1 = 2)

v. උදැල්ල, ජපන් පරිවර්ත්‍ය නඟුල, තැටි නඟුල (2 x 1 = 2)

vi. ගොඩ බෝග බීජ වප්කරය (2 x 1 = 2)

vii. ජල අවශෝෂණ ධාරිතාව වැඩි කරයි (2 x 1 = 2)
කැටායන හුවමාරු ධාරිතාවය වැඩිවේ
පාංශු ඛාදනය අඩුවේ
පාංශු ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකරයි
ශාක වර්ධනයට අවශ්‍ය පෝෂක රඳවා ගන්නා සංචිතයක් සේ ක්‍රියා කරයි
ක්ෂුද්‍ර ජීවී වර්ධනයට අවශ්‍ය උපස්ථර ලෙස ක්‍රියා කිරීම
පස කළු පැහැවන නිසා වැඩි තාප ප්‍රමාණයක් අවශෝෂණය කිරීමට හැකිවීම ..... ආදි කරුණු

viii. pH කඩදාසි භාවිතය (2 x 1 = 2)
pH මීටර භාවිතය

ix. පසට හුණුගල් කුඩු යෙදීම (2 x 1 = 2)
අළුහුණු යෙදීම
දියගැසූ හුණු යෙදීම
ඩොලමයිට් යෙදීම

x. බිංදු ජලසම්පාදනය (2 x 1 = 2)
විසිරි ජලසම්පාදනය

02.

i. පසේ භෞතික තත්ත්වය දියුණු කිරීම (උදා : පාංශු වාතනය, ව්‍යුහය, ජලවහනය දියුණුවීම) (1 x 4 = 4)
ඒ ඒ බෝගයට සුදුසු ලෙස භූමිය සකස් කිරීම පහසුවීම.
පසේ ඇති ගල් මුල් ආදිය පසෙන් ඉවත් කිරීම.
පසට පොහොර මිශ්‍ර කිරීම
පලිබෝධ පාලනය (උදා: මතු පිට ඇති වල්පැලෑටි පසට යට කර විනාශ කිරීම, කෘමි පලිබෝධ හා රෝගකාරක විනාශ කිරීම, කෘමි පලිබෝධ එළියට නිරාවරණය වී පක්ෂීන්ට ගොදුරු වී විනාශ වීම.

ii. (අ) තැටි නඟුල (1x 2 = 2)
කොකු නඟුල
රොටවේටරය
ජපන් පරිවර්ත්‍ය නඟුල
(ආ) ප්‍රාථමික බිම් සැකසීම (1x 2 = 2)
ද්විතියික බිම් සැකසීම

iii. A - අත් මුල්ලුව (1x 2 = 2)
B - අත් ස්කෝප්පය

03.

i. තවානේදී පැලවලට ගැලපෙන ලෙස පරිසර තත්ත්ව පාලනය කළ හැකිය. (1x 4 = 4)
ශක්තිමත් හා නිරෝගී පැල වැඩි සංඛ්‍යාවක් නිපදවා ගතහැකි වීම.
ක්ෂේත්‍රයේ කෙළින්ම සිටුවීමට අපහසු කුඩා බීජවලින් පැල නිපදවා ගත හැකිය.
ක්ෂේත්‍රයේ එක්වර බීජ සිටුවීමේදී අවශ්‍යවන බීජ ප්‍රමාණයට වඩා අඩු බීජ ප්‍රමාණයකින් අවශ්‍ය පැල සංඛ්‍යාව නිපදවා ගත හැක.
තවානකදී කුඩා පැල පහසුවෙන් බලාගත හැක.
නීරෝගීමත් ශක්තිමත් පැල පමණක් තෝරා ක්ෂේත්‍රයේ සිටුවිය හැකිය.
සමාන වර්ධනයක් සහිත පැල තෝරා ඒකාකාරී වගාවක් ලබා ගත හැක.
බද්ධ කිරීමට ග්‍රාහක පැල ලබා ගත හැක.

ii. (අ) වසුන් යෙදීම හා වසුන් ඉවත් කිරීම (1/2x 4 = 2)
සෙවණ සැපයීම
පොහොර යෙදීම
පැල දැඩි කිරීම
ජල සම්පාදනය
වල් මර්ධනය
රෝග ශා පලිබෝධ පාලනය
පැල ගැලවීම

(ආ) අලුත් පිදුරු (දිරාපත් නොවූ) (1/2x 2 = 1)
වියලි මානා
පිරිසිදු ගෝනි
වසුන් යෙදීමේ වාසි :- (1/2x 2 = 1)
බීජ ප්‍රරෝහණයට අවශ්‍ය තෙතමනය ආරක්ෂා වීම
බීජ ප්‍රරෝහණයට අවශ්‍ය උෂ්ණත්වය ලබාදීම
වල්පැල මතුවීම පාලනය වීම
වැස්සෙන් හෝ ජලසම්පාදනයෙන් පාත්තියට හා බීජවලට වන හානි අවම වීම
කුරුල්ලන්ගෙන් බීජවලට වන හානි අවම වීම

iii. ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු යොදන්න (10 වසර පෙළ පොත - පිටුව 81) (1/2 x 4 = 2)

04.

i. (අ) කාලගුණය - යම් ප්‍රදේශයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වාභාවයයි. එනම් වර්ෂාපතනය , උෂ්ණත්වය, වායු පීඩනය, සුළඟේ වේගය හා දිශාව, වාතයේ අඩංගු ජලවාෂ්ප ප්‍රමාණය හා සූර්ය විකිරණයේ ස්වභාවය එම ප්‍රදේශයේ කාළගුණය සේ හැඳින්වේ.

දේශගුණය - දීර්ඝ කාලයක් තුළ යම් ප්‍රදේශයක ඉහත කාළගුණික දත්ත අධ්‍යයනය කර ඒ ඇසුරින් දක්වන සාමාන්‍ය පරිසර තත්ත්වය දේශගුණය ලෙස හැඳින්වේ.

(1 x 2 = 2)

ii. (අ) A - ආරක්ෂිත වැස්ම (බාහිර සිලින්ඩරය) (4 x 1/2 = 2)
B - ජලය එක් රැස්වන බඳුන (අභ්‍යන්තර සිලින්ඩරය)
C - පූනීලය
D - ක්‍රමාංකිත මිනුම් සරාව
(ආ) X රූපය - වර්ෂාමානය (සරල වර්ෂාමානය) (1)
(අ) වර්ෂාපතනය, ආලෝකය, උෂ්ණත්වය, සුළඟ, සාපේක්ෂ ආර්ද්‍රතාවය (1/2 x 4 = 2)

iii. (අ) සූර්ය විකිරණමාන (1/2 x 2 = 1)
ඒකකය - ලක්ස්
(ආ) මෝසම් වැසි (නිරිත දිග හා ඊසාන දිග මෝසම) (2 x 1 = 2)
සංවහන ක්‍රියාවලිය මගින් ලැබෙන වැසි
වාසුළි වැසි

05.

i. (අ) A - කුකර්බිටේසි කුලය (1 x 3 = 3)
B - සොලනේසී කුලය
C - රුටේසියේ කුලය

(ආ) බිම් සැකසීමේදී (1 x 2 = 2)
පොහොර යෙදීමේදී
බද්ධ කිරීම සඳහා ශාක තෝරා ගැනීමේදී
රසායනික වල් නාශක භාවිතයේදී
පලිබෝධ පාලනයේදී

ii. (අ) අපනයන ආර්ථික බෝග (1 x 1 = 1)

(ආ) හණ, කපු (1/2 x 2 = 1)

iii. සූර්ය තාපය මගින් (1 x 3 = 3)
පිළිස්සීම මගින්
උණු ජලය යෙදීම මගින්
රසායනික ද්‍රව්‍ය යෙදීමෙන්

06.

i. (අ) ප්‍රභාසංස්ලේෂණය ඇතුළු කායික ක්‍රියාවලිය සඳහා (1/2 x 4 = 2)
බීජ ප්‍රරෝහණයට
බීජ පැළ සිටුවීම සඳහා
සමහර බීජවල ව්‍යාප්තිය සඳහා
ශාකවල සන්ධාරක ගුණය පවත්වා ගැනීම සඳහා
ශාක පෝෂක අවශෝෂණය සඳහා
බිම් සැකසීමේ පහසුව පිණිස
පසේ අහිතකර රසායන ද්‍රව්‍ය ඉවත් කිරීමේ මාධ්‍යයක් ලෙස
අල බෝගවල අස්වනු නෙලීමේ පහසුව සඳහා
කෘෂි රසායන ද්‍රව්‍ය මිශ්‍ර කිරීමේ මාධ්‍යයක් ලෙස
වී වගාවේ වල් පැල පාලනය සඳහා

(ආ) උත්ස්වේදනය (1/2 x 4 = 2)
වාෂ්පීකරණය
වෑස්සීම
ජලවහනය

ii. පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම (1 x 3 = 3)
පසට වසුන් යෙදීම
වල්පැලෑටි ඉවත් කිරීම
මතුපිටින් ඉවතට ගලා යන ජලයට බාධා කිරීම
පලතුරු හා විසිතුරු ශාකවල අනවශ්‍ය අතු හා පත්‍ර ඉවත් කිරීම

iii. වගාකර ඇති බෝගය (1 x 3 = 3)
බෝගයේ වර්ධන අවස්ථාව
ජලය සැපයීමේ අරමුණ
පසේ වයනය

07.

i. - මහා වංශයට අනුව විජයාවතරණය අවස්ථාවේදී කුවේණිය විසින් ක්ෂණිකව ආහාර පිස ඔවුන්ට සංග්‍රහ කිරීම (1 x 3 = 3)
- පණ්ඩුකාභය කුමරුට ස්වර්ණපාලි කුමරිය මූණ ගැසෙන්නේ කෙතේ වැඩ කරමින් සිටි පියාට ඇඹුල ගෙන යන අවස්ථාවේදීය
- මඩ සෝදාගත් කළ ගොවියා රජකමටත් සුදුසුය යන කියමන රොබට් නොක්ස් විසින් පවසා තිබීම
- ඌවේ වෙල් ලක්ෂයක් තිබීම
- පැරකුම්බා රජ සමයේ ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය ලෙස හැඳින්වීම

ii. - ශ්‍රී ලංකාවේ බිහි වූ ගොවිජන පද හා බහු කාර්ය යෝජනා ක්‍රම (4 x 1/2 = 2)
- ගල් ඔය යෝජනා ක්‍රමය
- උඩවලව යෝජනා ක්‍රමය
- නිල්වලා යෝජනා ක්‍රමය
- ලුණුගම් වෙහෙර යෝජනා ක්‍රමය
- මව් ආර ව්‍යාපාරය
- මහවැලි යෝජනා ක්‍රමය
- ඉඟිනිමිටිය යෝජනා ක්‍රමය
- මුතු කණ්ඩිය ව්‍යාපාරය

iii. (අ) අවශ්‍ය අවස්ථාවේදී අවශ්‍ය ප්‍රමාණවලින් නියමිත ගුණාත්මයෙන් යුක්තව අවශ්‍ය ආහාර වර්ගයක් ලබාගැනීමට ඇති හැකියාව (2)

(ආ) - කෘෂිකාර්මික අංශය (1 x 3 = 3)
- කාර්මික අංශය
- සේවා අංශය